OL/2022(2023)/11/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## බුද්ධ ධර්මය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. බුදුරජාණන් වහන්සේ තම පළමු ධර්මදේශනය පැවැත්වූ ස්ථානය හා උන්වහන්සේගේ පරිනිර්වාණය සිදු වූ ස්ථානය දැක්වෙන වරණය කුමක් ද?
(1) ලුම්බිණි සල් උයන හා උපවත්තන සල් උයන (2) ලුම්බිණි සල් උයන හා ඉසිපතන මිගදාය
(3) ඉසිපතන මිගදාය හා සත්තපණ්ණි ගුහාව (4) ඉසිපතන මිගදාය හා උපවත්තන සල් උයන

2. සිදුහත් බෝසතුන්ගේ අනුපමේය රූපශ්‍රීය හා ශාන්තබව දැක "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙතියි" ප්‍රකාශ කරනු ලැබුවේ,
(1) සුජාතා සිටු දියණිය විසිනි. (2) ප්‍රජාපතී ගෝතමිය විසිනි.
(3) කිසා ගෝතමිය විසිනි. (4) මාගන්ධිය බිසව විසිනි.

3. රෝගියකු හට වෛද්‍යවරයකුගේ සේවය (වෙදකම) තරමටම, උපස්ථායකගේ සේවය (හෙදකම) වැදගත් වන බව බුදුරජාණන් වහන්සේ ආදර්ශයෙන් ම පෙන්වා දුන් අවස්ථාවකට නිදසුනක් වන්නේ,
(1) සුනීත කථා පුවතයි. (2) සෝපාක කථා පුවතයි.
(3) මට්ටකුණ්ඩලී කථා පුවතයි. (4) පූතිගත්තතිස්ස කථා පුවතයි.

4. සංග්‍රාම භූමියක සිටින ඇතෙකුට සතුරාගෙන් කෙතරම් හී පහර වැදුන ද පසුපසට නොයන්නාක් මෙන් නින්දා ප්‍රශංසා ආදිය හමුවේ නොසැලී ඉදිරියට යාමේ හැකියාවක් බුදුරජාණන් වහන්සේට විය. මෙය,
(1) පුරිසදම්ම සාරථී ගුණය නමින් හැඳින්වේ. (2) තාදී ගුණය නමින් හැඳින්වේ.
(3) මහා කරුණා ගුණය නමින් හැඳින්වේ. (4) යථාවාදී තථාකාරී ගුණය නමින් හැඳින්වේ.

5. නිවන් පසක් කිරීමට අවශ්‍යවන මනා වූ ප්‍රතිපත්ති රකින බැවින් මහාසංඝරත්නය,
(1) සුපටිපන්න නම් වන සේක. (2) උජුපටිපන්න නම් වන සේක.
(3) ඤායපටිපන්න නම් වන සේක. (4) සාමීචිපටිපන්න නම් වන සේක.

6. බුදුරජාණන් වහන්සේ අන්‍ය ආගමික ආරාමවලට වැඩම කළ කල්හි ඉතා උණුසුම් ආකාරයෙන් උන්වහන්සේ පිළිගනු ලැබූ බව බොහෝ සූත්‍රවල දැක්වේ. මෙයින් ප්‍රකට වන්නේ උන්වහන්සේ තුළ පැවති,
(1) ආගමික සහනශීලී බවයි. (2) උපේක්ෂා සහගත බවයි.
(3) අකම්පා‍ය ගුණයයි. (4) මහා කරුණා ගුණයයි.

7. බුදුරජාණන් වහන්සේ, පිප්ඵලී ගුහාවට වැඩමකොට සත්ත බොජ්ඣංග ධර්මය දේශනා කිරීමෙන් පසු එය ශ්‍රවණය කොට තම රෝගී තත්ත්වයෙන් මිදුනේ,
(1) මහා කාශ්‍යප හිමි ය. (2) ගිරිමානන්ද හිමි ය.
(3) මහ මුගලන් හිමි ය. (4) චුන්ද හිමි ය.

[දෙවැනි පිටුව බලන්න.

8. ස්වාභාවික පරිසරයම දම්සභා මණ්ඩප බවට පත් කරගත් අවස්ථා රැසක් ගෞතම බුදුසිරිතෙන් ප්‍රකට වේ. ඒ අනුව උන්වහන්සේ වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කළේ,
   (1) අචිරවතී නදී තීරයේ පිහිටි අඹ වනයේ දී ය.
   (2) චම්පා නුවර අසල ගග්ගරා පොකුණ සමීපයේ දී ය.
   (3) ගිජ්ජකූට පර්වතයේ සූකරඛත ලෙනෙහි දී ය.
   (4) විශාලා මහනුවර වන පියසක දී ය.

9. සිදුහත් බෝසතාණන් වහන්සේ ද නෙක්ඛම්ම පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය ප්‍රකට වන ජාතක කථාව කුමක් ද?
   (1) ලෝමහංස ජාතකය
   (2) මඛාදේව ජාතකය
   (3) තේමිය ජාතකය
   (4) මහාකපි ජාතකය

10. තණ්හා මාන මිථ්‍යාදෘෂ්ටීයෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව තමාගේත් අනුන්ගේත් අභිවෘද්ධිය පිණිස බලවත් උත්සාහය ඇති කරගනිමින් සම්පූර්ණ කරන පාරමිතාව හඳුන්වන්නේ,
   (1) ප්‍රඥා පාරමිතාව නමිනි.
   (2) වීර්ය පාරමිතාව නමිනි.
   (3) අධිෂ්ඨාන පාරමිතාව නමිනි.
   (4) ක්ෂාන්ති පාරමිතාව නමිනි.

11. බුදුරජාණන් වහන්සේ, ගිරිමානන්ද හිමියන්ට රෝග වැළඳීමට හේතුවන කරුණු අටක් දේශනා කළහ. එම කරුණු අතරට අයත් **නොවන** කරුණ කුමක් ද?
   (1) පිත් ධාතුව කිපීම
   (2) සෙම් ධාතුව කිපීම
   (3) සෘතු විපර්යාස හේතු වීම
   (4) කර්ම විපාක පදනම් වීම

12. බුදුරජාණන් වහන්සේ, "යමෙක් මල් පලතුරු උයන්, වනාන්තර වවත් ද, ඒදඬු පාලම් පැන්හල් පොකුණු තනා දෙත් ද ඔවුන්ට දිවා රෑ පින් වැඩේ." යනුවෙන් දේශනා කළේ,
   (1) අනේපිඬු සිටුතුමා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.
   (2) තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.
   (3) උත්තරා දෙවියෙක් විමසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.
   (4) විශාඛාව විමසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.

13. ජාතික, ආගමික හා සංස්කෘතික විවිධත්වයක් ඇති ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයෙන් ක්‍රියාකිරීම සඳහා අදාළ **නොවන** කරුණ කුමක් ද?
   (1) කුමන ආගමකට ජාතියකට අයත් අයෙකුට වුව ද අවැඩක් නොකර සිටීම ය.
   (2) සියලු ජාතීන් කෙරෙහි සතර සංග්‍රහ වස්තුවලට අනුව පැවතීම ය.
   (3) වෙනත් ආගමික සිද්ධස්ථානවලට ගරු කිරීම හා හානි නොකිරීම ය.
   (4) සෑම ආගමකින්ම උගන්වන්නේ එක ම දෙයක් බව පිළිගෙන සියලු ආගම් ඇදහීම ය.

14. "ස්වාමීනි මම බොහෝ දේ පාඩම් කර ඇත්තෙමි. එහෙත් දැන් ඒවා මතකයට නංවා ගත නොහැකි ය. එයට හේතුව කුමක්දැයි" බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි බමුණෙක් විමසූ කල්හි උන්වහන්සේ දේශනා කළේ,
   (1) පංච නීවරණ ධර්ම සිත තුළ ක්‍රියාත්මක වීම නිසා මතකයට නොඑන බවයි.
   (2) අකුසල මූල තුන සිත තුළ ක්‍රියාත්මක වීම නිසා මතකයට නොඑන බවයි.
   (3) සතර අගතියෙන් යුතුව කටයුතු කිරීම නිසා මතකයට නොඑන බවයි.
   (4) පස් පව්වල නිරතවීම නිසා මතකයට නොඑන බවයි.

15. කුසල ධර්ම දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාව බව පෙන්වා දී ඇත. මෙහිදී කුසල ධර්ම යන්නෙන් අදහස් වන්නේ,
   (1) නිරෝගී, නිවැරදි, දක්ෂ යන්නයි.
   (2) සැහැල්ලු, පිංවත්, නිවැරදි යන්නයි.
   (3) යහපත්, ගුණවත්, නිරෝගී යන්නයි.
   (4) දක්ෂ, ධාර්මධර, ශික්ෂාකාමී යන්නයි.

16. සමථ භාවනාවේ දී කෙටි කලකින් උසස් ප්‍රතිඵල ලබාගැනීමට අනුගමනය කළ යුතු වඩාත් වැදගත් පිළිවෙත වන්නේ,
   (1) සම පතළිස් කර්මස්ථාන ඉගෙන ගැනීමයි.
   (2) උපදේශ සහිත ව චරිතයට සුදුසු කර්මස්ථානයක් වැඩීමයි.
   (3) පුද්ගල චරිත ලක්ෂණ හඳුනාගෙන තිබීමයි.
   (4) භාවනාවේ පූර්ව අවශ්‍යතා ගැන මනා දැනීමක් ලබා ගැනීමයි.

17. "ඔබ වහන්සේගේ ශාස්තෘවරයා දෙසන දහම කුමක් ද?"
"හේතු ප්‍රත්‍ය ඇතිකල ඇතිවන්නා වූ ධර්මයෝ හේතු ප්‍රත්‍ය නැතිකල නැති වෙත් යන දහම මාගේ ශාස්තෘ බුදුරජාණන් වහන්සේ දේශනා කරති."
ඉහත ප්‍රශ්නය නැගූ හා ඊට ඉහත පිළිතුර ලබාදුන් දෙදෙනා වනුයේ,
   (1) සංජය පිරිවැජියා හා අස්සජි හිමි ය.
   (2) කෝලිත පිරිවැජියා හා අස්සජි හිමි ය.
   (3) උපතිස්ස පිරිවැජියා හා අස්සජි හිමි ය.
   (4) උපතිස්ස පිරිවැජියා හා කොණ්ඩඤ්ඤ හිමි ය.

[අනෙක් පිටුව බලන්න.

18. නාම රූප ධර්ම හේතුකොට ගෙන ආයතන හය (ෂඩායතන) ඇතිවන බව පටිච්චසමුප්පාදයේ දැක්වේ. එම ආයතන හය දැක්වෙන වරණය කුමක් ද?
   (1) නාම, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ
   (2) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම
   (3) පඨවි, ආපෝ, තේජෝ, වායො, ආකාස, සුඤ්ඤ
   (4) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන

19. පුනර්භවය තහවුරු කරන සත්ත්වයාගේ පෙර භවයන්හි පැවැත්ම හා මතු භවයන්හි පැවැත්ම දක්නා ඥාණයන් හඳුන්වන්නේ,
   (1) පුබ්බේ නිවාසානුස්සති හා චුතූපපාත ඥාණ යනුවෙනි.
   (2) පුබ්බේනිවාසානුස්සති හා ආසවක්ඛය ඥාණ යනුවෙනි.
   (3) චුතූපපාත හා ඉද්ධිවිධ ඥාණ යනුවෙනි.
   (4) දිබ්බසෝත හා පරචිත්තවිජානන ඥාණ යනුවෙනි.

20. බුදුදහමට අනුව දුකින් මිදීමට අදාළ මග අනුපූර්ව ශික්ෂාවකි. අනුපූර්ව ක්‍රියාවලියකි. අනුපූර්ව ප්‍රතිපදාවකි. මෙම අනුපිළිවෙළින් යා යුතු ගමන් මගෙහි පළමු පියවර ලෙස සැලකෙන්නේ,
   (1) සමාධියයි. (2) ප්‍රඥාවයි. (3) සද්ධාවයි. (4) භාවනාවයි.

21. මහ ඇතාගේ අඩි පලකුණු තුළට වනයේ වෙසෙන ඕනෑම සතෙකුගේ අඩි සලකුණු ඇතුළු කළ හැකිවන්නා සේම, අවුරුදු හතළිස් පහක් මුළුල්ලේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය ඇතුළත් කළ හැකි ප්‍රධාන ම ධර්ම කරුණ වන්නේ,
   (1) සතර සතිපට්ඨානයයි. (2) චතුරාර්ය සත්‍යයයි.
   (3) සතර සංග්‍රහ වස්තුවයි. (4) සතර සෘද්ධිපාදයයි.

22. මරණින් මතු පළමු ආත්මභාවයේ දී හෙවත් ඊළඟ භවයේ දී විපාකදීමට ඉදිරිපත්වන කර්ම හඳුන්වන්නේ,
   (1) දිට්ඨධම්මවේදනීය කර්ම ලෙස ය. (2) උපපජ්ජවේදනීය කර්ම ලෙස ය.
   (3) අපරාපරියවේදනීය කර්ම ලෙස ය. (4) අහෝසි කර්ම ලෙස ය.

23. වෙනත් සත්ත්ව වර්ගයා අතර ජීව විද්‍යාත්මක වෙනස්කම් දැක්වීමට බොහෝ සාධක පැවතිය ද මිනිසා පිළිබඳ එබඳු වෙනස්කම් දැක්විය නොහැකි බවත් ලිංග ජාති වශයෙන් මිනිසුන් අතර සමානත්වයක් ඇති බවත් දේශනා කරනු ලැබුයේ,
   (1) වසල සූත්‍රයේ දී ය. (2) කසීභාරද්වාජ සූත්‍රයේ දී ය.
   (3) වාසෙට්ඨ සූත්‍රයේ දී ය. (4) අග්ගඤ්ඤ සූත්‍රයේ දී ය.

24. දානය හා ධර්මානුකූල හැසිරීම යන මඟුල් කරුණු දැක්වෙන මංගල සූත්‍ර දේශනා පාඨය ඇතුළත් වරණය කුමක් ද?
   (1) "දානං සීලං පරිච්චාගං" (2) "දානං සීලං ච භාවනා"
   (3) "දානං සග්ගස්ස සෝපාණං" (4) "දානං ච ධම්මචරියාච"

25. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි පැවිදි පක්ෂය විසින් ගිහි ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් අතරට අයත් නොවන කරුණ වන්නේ,
   (1) පවින් වැළැක්වීම ය. (2) යහපත් ක්‍රියාවල යෙදවීම ය.
   (3) මෛත්‍රී සහගතව කථා කිරීම ය. (4) සුගතියට මග කියාදීම ය.

26. පුද්ගලයකුගේ දියුණුවට මෙන්ම පරිහානියට ඉවහල්වන කරුණු සඳහන් කරමින් දේශනා කරන ලද්දේ,
   (1) මංගල හා වසල සූත්‍රයි. (2) මංගල හා සිගාලෝවාද සූත්‍රයි.
   (3) මංගල හා පරාභව සූත්‍රයි. (4) පරාභව හා වසල සූත්‍රයි.

27. ගිහි ජීවිතය හා සම්බන්ධව සැලකීමේ දී ජීවිත හා දේපල ආරක්ෂාවීම, පවුල් ජීවිතයේ සාමය හා සතුට ඇතිවීම, විශ්වාසය, මනා සිහිබුද්ධිය හා සෞඛ්‍ය ඇතිවීම යන කරුණු සුරක්ෂිත වන්නේ,
   (1) දස පින්කිරියවත්වල යෙදීම තුළිනි. (2) පංචශීල ප්‍රතිපත්තියෙහි පිහිටා කටයුතු කිරීම තුළිනි.
   (3) ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවල යෙදීම තුළිනි. (4) සතර සංග්‍රහවස්තුවල යෙදීම තුළිනි.

28. "තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. වැඩදායක යහපත් දේ කිරීම අපහසු ය." මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
   (1) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන්නයි.
   (2) "යො වෙ වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතො" යන්නයි.
   (3) "සුකරානි අසාධූනි - අත්තනො අහිතානි ච" යන්නයි.
   (4) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති" යන්නයි.

[හතරවැනි පිටුව බලන්න.

29. නුවණින් පිරික්සා, සිතා විමසා කටයුතු කිරීම, රෝග නිධානය විමසා පිළියම් කරන වෛද්‍යවරයකු මෙන් ක්‍රියා කිරීම, දොස් නිදොස් සොයා බලා නිදොස් දේ කිරීම යන අදහස් ඇතුළත් පාඨය කුමක් ද?
(1) සුචිකම්ම (2) නිසම්මකාරී (3) සඤ්ඤත (4) ධම්මජීවී

30. බුදුරජාණන් වහන්සේ විසින් සිත්කලු ස්ථාන ලෙස වර්ණනා කරන ලද නිග්‍රෝධය, චෞර ප්‍රපාතය, කාලශිලාව, සප්ප සොණ්ඩික පබ්භාරය හා තපෝදාරාමය වැනි ස්ථාන පිහිටියේ,
(1) විශාලා මහනුවරයි. (2) රජගහ නුවරයි. (3) කුසිනාරා නුවරයි. (4) සැවැත් නුවරයි.

31. දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් පරිදි දළ්හනේමි නම් සක්විති රජු සතුව පැවති සප්තරත්නය අතුරෙන් චක්‍රරත්නයෙන් සංකේතවත් කරන්නේ,
(1) රාජ්‍යත්වයයි. (2) රජුගේ රියසකයි. (3) චක්‍රාවාටයයි. (4) රාජ්‍ය ආරක්ෂාවයි.

32. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කෙරෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – රාජ්‍ය පාලකයින් සමගිව ක්‍රියා කළ යුතු ය.
B – රාජ්‍ය තුළ අධාර්මික ක්‍රියා මැඩලිය යුතු ය.
C – නීතිය කඩ නොකොට ආරක්ෂා කළ යුතු ය.
D – විශාරදයන්ගෙන් උපදෙස් ලබා ගත යුතු ය.
මෙම ප්‍රකාශ අතුරෙන් සප්ත අපරිහානිය ධර්මවලට අයත් ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
(1) A පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි. (4) C සහ D පමණි.

33. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ ගණයට ඇතුළත් **නොවන්නේ**,
(1) මුනිගුණාලංකාරයයි. (2) බුද්ධගුණාලංකාරයයි.
(3) සාරාර්ථ සංග්‍රහයයි. (4) සතර බණවර සන්නයයි.

34. ඉංග්‍රීසි පාලන සමයේ පිරිහීමට පත්ව තිබූ බෞද්ධ අධ්‍යාපනය හා බුදුදහම නගා සිටුවීමට දේශහිතෛෂී පිරිස් සමග එක් වී පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවනු ලැබුවේ,
(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි. (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසිනි.
(3) අනගාරික ධර්මපාලතුමන් විසිනි. (4) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් විසිනි.

35. පංචසතිකා සංගීතිය නමින් හැඳින්වෙන්නේ,
(1) පළමු ධර්ම සංගායනාවයි. (2) දෙවන ධර්ම සංගායනාවයි.
(3) තෙවන ධර්ම සංගායනාවයි. (4) සිව්වන ධර්ම සංගායනාවයි.

36. තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) අභිධර්ම පිටකයට කථාවත්ථුප්පකරණය එක්වීම ය.
(2) දුස්සීල මහණුන් සසුනින් නෙරපීම ය.
(3) ත්‍රිපිටකය කටපාඩමින් රැගෙන යාමට භාණක පරපුරකට පැවරීම ය.
(4) දේශීය හා විදේශීය ධර්ම ප්‍රචාරය සිදුවීම ය.

37. පුරා විද්‍යාඥයින්ගේ මතයට අනුව බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය සිදු වී ඇත්තේ,
(1) ක්‍රි.පූ. පළමුවන සියවසේ දී ය. (2) ක්‍රි.පූ. තෙවන සියවසේ දී ය.
(3) ක්‍රි.ව. පළමු සියවසේ දී ය. (4) ක්‍රි.ව. තෙවන සියවසේ දී ය.

38. ලක්දිව බුදුදහම ස්ථාපිත වීමත් සමඟ දේවානම්පියතිස්ස රජතුමා විසින් ඉදිකරන ලද ථූපාරාම දාගැබෙහි තැන්පත් කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,
(1) ග්‍රීවා ධාතුව ය. (2) දකුණු අක ධාතුව ය.
(3) ලලාට ධාතුව ය. (4) වම් අකු ධාතුව ය.

39. ස්තූපය සඳහා ඉදි වූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය චෛත්‍යඝර හෙවත් වටදාගෙය නමින් හැඳින්වෙන අතර පැරණි ලක්දිව චෛත්‍යඝර අතර කලාත්මක බවින් අනූන වටදාගෙය පිහිටා ඇත්තේ,
(1) ථූපාරාමයේ ය. (2) අම්බස්තලයේ ය. (3) ලංකාරාමයේ ය. (4) මැදිරිගිරියේ ය.

40. ශ්‍රී ලාංකේය බෞද්ධ සිතුවම් කලාව විෂයයෙහි භාරතීය ආභාසය ප්‍රබලව සිදුව ඇත. එහිලා ඉන්දියාවේ පැරණි අජන්තා සිතුවම්වලට නෑකම් කියන සිතුවම් විද්‍යමාන වන්නේ,
(1) දඹුලු විහාර සිතුවම් තුළයි. (2) සීගිරි සිතුවම් තුළයි.
(3) කැලණි විහාර සිතුවම් තුළයි. (4) දිඹුලාගල සිතුවම් තුළයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1. (i) සිදුහත් බෝසතාණන් කිං කුසලගවේසී ව සිටි කාලයේ හමු වූ සමාපත්තිලාභී තවුසන් **දෙදෙනාගේ** නම් ලියන්න.
(ii) 'අරහං' බුදු ගුණයෙහි අර්ථය ලියන්න.
(iii) ලෝමහංස ජාතකයෙන් ප්‍රකට කෙරෙන්නේ අප මහ බෝසතාණන් වහන්සේ සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?
(iv) සමථ භාවනාවෙන් ලැබිය හැකි ප්‍රයෝජන **දෙකක්** ලියා දක්වන්න.
(v) "දානං සීලං ච නෙක්ඛම්මං" යන ගාථාවෙන් දැක්වෙන්නේ කිනම් ධර්ම කරුණු පිළිබඳව ද?
(vi) ත්‍රි ශික්ෂාව නම් කරන්න.
(vii) "සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනො" මෙම පාඨයේ අදහස ලියන්න.
(viii) ස්තූපාංග **හතරක්** නම් කරන්න.
(ix) "සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධො" මෙහි අදහස පහදන්න.
(x) ශ්‍රද්ධාවේ ප්‍රභේද **දෙක** නම් කරන්න.

2. (i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන පරිදි පුද්ගලයාගේ මෙලොව හිතසුව පිණිස **පවතින** කරුණු අතුරෙන් **දෙකක්** ලියන්න.
(ii) ඉහත (i) හි කරුණුවලින් **එක්** කරුණක් පැහැදිලි කරන්න.
(iii) යුතුකම් ඉටුකරන දැහැමි සමාජයක් ගොඩනැගීම සඳහා පංචබලි සංකල්පය ඉවහල්වන අයුරු පැහැදිලි කරන්න.

3 (i) "නතං කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කොට ලියන්න.
(ii) එම ගාථාවේ අර්ථය ලියන්න.
(iii) "අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීමෙන් දෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදය උපදෙස් සපයයි" විමසන්න.

4. (i) දස රාජ ධර්මවලට අයත් කරුණු අතුරෙන් **දෙකක්** නම් කරන්න.
(ii) සතර සංග්‍රහ වස්තු නම් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න.
(iii) ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා බෞද්ධ දේශපාලන මූලධර්ම ඉවහල්වන ආකාරය විස්තර කරන්න.

5. (i) පංච නියාම ධර්ම අතුරෙන් **දෙකක්** නම් කරන්න.
(ii) විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද **හතර** දක්වා ඉන් **එකක්** සැකෙවින් පහදන්න.
(iii) ශිෂ්‍ය ජීවිතයේ ගැටලු විසදාගැනීම සඳහා පටිච්ච සමුප්පාද න්‍යාය උපයෝගී කොටගත හැකි ආකාරය පහදන්න.

6 (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා හේතු වූ කරුණු අතුරෙන් **දෙකක්** ගෙනහැර දක්වන්න.

(ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, රාජානුග්‍රහය ලබා දුන් පාලකයා හා මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ ලියා දක්වන්න.

(iii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසන ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පහදන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) රේරුකානේ චන්දවිමල මහනාහිමි

(ii) මෛත්‍රී භාවනාව

(iii) සම්මා ආජීව

(iv) බුද්ධ ප්‍රතිමාව

* * *